# භාෂා පරිණාමය සහ භාෂා සම්පර්කය

තපෝවනයේ සුතධර හිමි

The changes that occur in the phonology, morphology, syntax, and semantics of a language draw the attention of linguists who study that particular language historically. General tendency of linguists who study the changes of a language is to look for language internal reasons to explain them. But there also can be language external reasons such as Language Contact which cause linguistic change. In this paper the significance of Language Contact in both synchronic and diachronic studies has been discussed using illustrations from Sri Lankan Malay, Sinhala, Tamil, and Melanesian Pidgin.

භාෂාව අනිකුත් සියලු දේ සේම නිරන්තර වෙනසකට පත්වන්නේ එහි ගතික (dynamic) ස්වභාවය නිසාය. භාෂාවේ සතත විපරිණාමය භාෂක අවධානයට යොමු වන්නේ එම විපරිණාමය නිසා සන්නිවේදනයට යම් බාධාවක් ඇතිවුවහොත් පමණි. භාෂාව මානවයාගේ ප්‍රධානතම සන්නිවේදන මාධ්‍යය වන අතරම එය පුද්ගලාන්තර සම්බන්ධතා දියුණු කිරීමේදී විශේෂ කාර්යභාරයක් ඉටු කරන්නකි. පුද්ගලාන්තර සබඳතා එකම භාෂක සමාජයකට සීමා නොවේ. කිසියම් භාෂක සමාජයක් වෙනත් භාෂාවක් කථා කරන සමාජයක් සමග සබඳතා පැවැත්වීම ඉතා ස්වාභාවිකය. සෑම මානව කණ්ඩායමක්ම ගෙන බලනවිට ඊටම විශේෂ වූ භාෂාවක්ද වෙයි. සමහරවිට ඔවුන්ගේ භාෂාව එම භාෂක සමාජයෙන් ගිලිහී ගොසිනි. එසේවුවද සිය අනන්‍යතාව දක්වීමේදී ඒ සමාජය භාවිත කළ භාෂාව එම සමාජය වෙන්කොට දක්වයි.

විවිධ භාෂා කථා කරන සමාජයක් තුළ ඇති සමාජ සම්බන්ධතා එකිනෙකාගේ භාෂාවන් ඉගෙනීම සඳහා යම් දිරියක් ලබා දෙයි. එක භාෂාවක් කථා කරන මානවයකු වෙනත් බසක් තම මව් බසට සමාන්තරව ප්‍රගුණ කිරීම නිසා 'ද්විභාෂක' නාමය ලබයි. මේ ද්විභාෂකත්වය මගින් භාෂා දෙකෙහිම වෙනස්වීමට බලපෑමක් සිදු කරයි. වෙයින්රයිෂ් (Weinreich) නම් ශාස්ත්‍රඥයා සඳහන් කරන පරිදි භාෂා සම්පර්කය සිදුවන ස්ථානය (Locus of Language Contact) ද්විභාෂක මනසයි (Weinreich 1963:71). ද්විභාෂකත්වය සිදුවන්නේ එක පුද්ගලයකුගේ මනස